


ආනන්දය සැලකෙන්නේ බෞද්ධ විද්‍යාලයක් හැටියට ය. මෙයට හේතුව නම් ලංකාව බ්‍රිතාන්‍ය පාලනයට යටත්ව තිබූ සමයේ ඔවුන් ගේ අනුදැනුම ද ඇතිව මිෂනාරිවරුන් පවත්වාගෙන යමින් තිබූ කතෝලික හා ක්‍රිස්තියානි ආගමික විද්‍යාලයන් ට විකල්පයක් ලෙස ආනන්ද, මහින්ද, ධර්මරාජ, මියුසියස් යනාදී පාසල් සමූහය බෞද්ධ පවුල්වල සිසුන් ට ආගමික පසුබිම ද සහිතව හොඳ ඉංගිරිසි අධ්‍යාපනයක් ලබා දීමේ අරමුණින් පිහිටුවා තිබූ හෙයිනි.

එනම්, එක්කෝ හැතැප්ම දෙකේ නීතියෙන් බුරුලක් ගත හැකිනම් බොල්ලතේ කතෝලික පාසලට ඇතුලත් වීම හෝ නැත්නම් සිය පවුල ද සමග බොල්ලතේ පදිංචියට යෑම හෝ නැත්නම් ගමේ පාසලේ බුද්ධාගම ඉගෙන ගැනීමය!

අද ඕස්ට්‍රේලියාවේ ප්‍රාථමික පාසල්වල ආගම උගැන්වෙන්නේ රජයේ අනුග්‍රහයෙන් මූලික විෂයය මාලාවේ කොටසක් ලෙස නොව, ස්වේච්ඡා පදනමක් යටතේ ය. මෙය ස්ක්‍රිප්චර් හෙවත් ශුද්ධ ලියවිලි පාඩම් ලෙස හැඳින්වේ. අපේ දරුවන් මේ පාඩම් වලින් මුදවන ලෙස ඉල්ලා අපි පාසලට ලිපි යවමු. උන් ඒ වේලාවේ පුස්තකාලයට යති.

නමුත්, එදා ලංකාවේ බුද්ධාගම මිස වෙනත් ආගමක් විෂයක් ලෙස ඉගැන්වූ රජයේ පාසල් වල සිටි වෙනත් ආගමික පවුල්වල දරුවන් ගේ

එදා පටන් මම අනෙකුත් ළමුන් අත් ඔසවා බැඳගෙන පන්සිල් පද කියද්දී, අත් පහලම තබා පහසුවෙන් සිටිමින් මුණිවත රැක්කෙමි. නොදන්නා අයෙකු වූවා නම් මා අබෞද්ධ යයි සිතණු නොඅනුමාන ය.

මින් වසරකට පමණ පසු මා මැණියන් ගේ මහගෙදර මහා දනමය පුණ්‍ය කර්මයක් පැවැත්වුණි. අපේ පවුලේ සියළු දෙනාම ඊට සහභාගී වූහ. එදා දනයේ කටයුතු අවසාන වී භික්ෂූන් වහන්සේලා නික්ම ගිය පසු අපේ භෝජන කටයුතු ආරම්භ විය. මෙහිදී අපේ ආතා මා වෙත චෝදනා පත්‍රයක් ඉදිරිපත් කළේ ආගමික කටයුතු සිදුවෙද්දී පන්සිල් නොගෙන සිටීමෙන් මා මහා පාපකර්මයක් සිදුකළාක් මෙන් හඟවමිනි. පින්, පව් සහ පන්සිල් පිළිබඳ මා නැගූ තර්ක ඔහු කණකට වත් ගත්තේ නැත.

සමාදන් වීම අපේ ආතාට ප්‍රශ්ණයක් නොවීය. ඔහුට ප්‍රශ්ණයක් වූයේ මා සිල් නොගෙන සිටීමයි. මද පමණින් රහමෙර පාවිච්චි කර දහවල් කෑම ගත් ආතා, අවශ්‍ය වූයේ නම් සවස් වරුවේ නැවතත් සිල් ගැනීමට ද නොපැකිලෙණු ඇත.

අත් බැඳ සිල් නොගත්ත ද, මා සිල් රැකි බව අපේ ආතා ට නොවැටහුණි. ඒ වන විට වසර පණහකටත් වඩා කාලයක් රහමෙර ඇසුරු කර තිබූ ආතාගේ මොලේ මගේ තර්ක වටහා ගැනීමට අවශ්‍ය නියුරෝන ශෛල ඉතුරු වී නොතිබෙන්නට ඇත.

කෙසේ වෙතත්, මා එදා එකොලොස් වෙනි ශ්‍රේණියේ දී පන්සිල් ගත්තායින් පසු අද වෙනතුරුමත් පන්සිල් නොගත්තෙමි.

කැඩුණු සිල් පද කැඩුණි. රැකුණු සිල් පද

# පන්සිල් ගත් අන්තිම දා

***එදා දනය හමාර වී හාමුදුරුවරු ආපසු වැඩම කළ විගස තම කාමරයට ගිය ආතා, නිරතුරු තම ඇඳ යට තිබෙන පොල් අරක්කු බෝතලයෙන් "කාලක්-ක්‍රියා" කර ඇත. මෙහිදී ඔහුගේ සහයට සිටියේ, දනමය පුණ්‍ය කර්මයට සහභාගී වීමට නිවසට පැමිණ සිටි තම මස්සිනා ය. මෙය සුවිශේෂී සංසිද්ධියක් නොවේ. බොහොමයක් දනේ ගෙවල් වල ගිහියන්ට කරණ සංග්‍රහයට රහමෙර ද ඇතුලත් ය.***

ඒ කෙසේ වෙතත් මා දන්නා පරිදි මේ පාසල් හැටේ දශකය පමණ වන තෙක්ම පවත්වාගෙන ගියේ පෞද්ගලික පාසල් වශයෙනි. එනිසා, සල්ලිය බාගේ නොතිබුණු ගම්බද සාමාන්‍ය පවුල්වල සිසුන් ට තව දුරටත් රජය විසින් පවත්වාගෙන ගිය ස්වභාෂා පාසල් පද්ධතියේ ඉගෙනුම ලැබීමට සිදුවිය. හෝඩියෙන් පටන් ගෙන වසර දහයකින් පමණ තිබුණු අවසාන විභාගයෙන් අවසන් වූ මෙම ස්වභාෂා පාසල් ක්‍රමය ශිෂ්‍ය ගුරු තනතුරු සඳහා ඉලක්ක වූවක් පමණකි. මීට අමතරව ඉඩ තිබුණේ එක්කෝ ආයුර්වේද වෛද්‍යවරයෙක් හෝ නොතාරිස්වරයෙක් වීමට පමණි. හතලිහේ දශකයේ දී ගම්බද පලාත්වල මැදි මහා විදුහල් අරඹන තුරුම තත්වය එලෙසම පැවතුණි.

අප දැන් වසන ඕස්ට්‍රේලියාවේ මෙන් නොව ලංකාවේ ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ආගම එක් විෂයයක් ලෙස සැලකේ. මා උගත් කොස්සින්න කණිෂ්ඨ විද්‍යාලයේ සහ ගලහිටියාව මැදි විදුහලේ මේ සඳහා තිබුණේ එක් තේරීමක්, එනම් බුද්ධාගම, පමණකි. නිසැකවම, ආගම විෂයය යනු චිත්‍ර, නැටුම් සහ සංගීතය ලෙස විකල්ප තුනක් තිබූ සෞන්දර්ය විෂයය හෝ කෘෂිකර්මය, වඩුවැඩ, ලෝහ වැඩ, මැටි වැඩ, පේෂකර්මය යනාදී විකල්ප රාශියක් තිබූ ප්‍රාග වෘත්තීය විෂයය වැන්නක් සේ නොසැලකුණු බව පැහැදිලිය.

එසේ විකල්ප තිබුනද, පරම්පරානුගත බුද්ධාගමිකාරයින් වූ අප තෝරාගන්නේ බුද්ධාගම බවට කිසිදු සැකයක් නැත.

එසේ වුවද, තුන්වන ශ්‍රේණියේ දී අප ආගම විෂයයක් ලෙස පාසැලේ දී ඉගෙනීම ඇරඹූ සමයේ මගේ පන්තියේ සිටි එකම කතෝලික සිසුවා නම්, අන් විකල්ප විෂයයන් තිබුණා නම්, එවැනි විකල්පයක් තෝරා ගැනීමට ඉඩ තිබුණි. විකල්ප නොතිබුණු කල ඔහු ට ද සිදුවුනේ බහුතරය හා එක්ව බුද්ධාගම ඉගෙන ගැනීමයි.

අපේ නිවෙස් වලට නුදුරින් ම කතෝලික පාසල් තිබුනේ බස් රථ දෙකකින් යා යුතු වූ බොල්ලතේ බව ද කිව යුතුය. මගේ පියා සේවය කළේ මේ පාසලේ ය. ඔහු පාන්දර 5:45 ට නිවසින් පිටත් වෙයි.

හොඳින් කල්පනා කර බලන කළ මා මිතුරු කතෝලික සිසුවාට විකල්ප කිහිපයක් ම තිබුණි.

දෙමව්පියන් ට අද අපට ඇති ඉහත ප්‍රශ්ණය නොතිබුණි. ඔවුන්ගේ දරුවෝ විෂයයක් ලෙස බුද්ධාගම උගත්හ. විභාග ද සමත් වූහ. උදෑසන පන්සිල් ගනිද්දී ද සවස "යෝවද තම්පව" කියද්දී ද නිහඬව සිටියහ. එපමණකි.

සෑම රජයේ පාසලකම මෙන්ම ආනන්දයේ ද උදෑසන පන්සිල් ගැනීම සිරිතයි. පස්මහල් උසස් පෙල විද්‍යා ගොඩනැගිල්ල අසල මේ වතාවත පැවැත්වුනේ ගුරුවර භික්ෂුවක ගේ මූලිකත්වයෙනි. එය ශබ්ද විකාශන පද්ධතිය මගින් මුළු පාසල පුරාම විසුරුවා හරින ලදී. පන්ති කාමර වලින් පිටත රැස්වෙන සිසුවෝ පන්සිල් ගත්හ. සිංහලෙන් සහ ඉංගිරිසියෙන් පාසල් ප්‍රවෘත්ති වලට ද, සතියකට වරක් පමණ පැවැත්වුණු අනෙකුත් අනුසාශනා වලට ද සවන් දුන්හ.

මා එකොළොස් වන ශ්‍රේණියේ උගන්නා කාලයේ දිනක් එවැනි අනුසාශනාවක් කළ හාමුදුරු නමක් අප දිනපතාම පන්සිල් ගත යුත්තේ ඇයි දැයි පහදු දෙමින් කථා කළහ.

නමුත් අවාසනාවකට මෙන් මේ දේශනය අවසානයේ මට හොඳින් පැහැදිලි වූයේ දිනපතාම පන්සිල් ගැනීම නිෂ්ඵල ක්‍රියාවක් බවයි. එතෙක් පාසල් දිනවල පන්සිල් ගත් මම එතැන් සිට පන්සිල් නොගත්තෙමි.

මේ තීරණය ගැනීමට මූලික හේතුව වූ මගේ සිත තුල ඉපිද සිත ජයගත් තර්කය වූයේ පන්සිල් යනු තමන් විසින් තමන්ටම දෙන පෞද්ගලික පොරොන්දුවක් නිසාත්, එහි නාමික අගයක් මිස අන් වැදගත්කමක් නැති නිසාත්, පන්සිල් ගැනීමෙන් හෝ පන්සිල් පිළිපැදීමෙන් හෙවත් පව් නොකර සිටීමෙන් අමුතුවෙන් ලැබෙන පිණක් නොමැති නිසාත් යන විවිධ කරුණු නිසා පන්සිල් ගැනීම අනවශ්‍ය ක්‍රියාවක් ය යන්නයි.

අවශ්‍ය වනුයේ පව් නොකර සිටීමයි. එයිනුත් ඉදිරියට ගොස් හැකි පමණ පුණ්‍ය කර්ම සිදුකිරීමයි. පන්සිල් නොගෙන සිටීමෙන් නොවෙන පවක්, අප පන්සිල් සමාදන් වී පසුව ඒ සිල් බිඳීමෙන් වෙතොත් එය පුදුමයක් නොවේ.

අනිත් අතර බිඳෙන බව දැන දැනම කුමට ඒ සිල් සමාදන් වන්නේද? හවස රහමෙර බොන්නෙකු උදයේ කුමකට නම් සුරාමේරය මජ්ඣපමා කියන්නේ ද?

වයස අවුරුදු හැත්තෑව ද ඉක්මවා සිටියෙකුගේ බැණ වැදීමක් අවුරුදු දහ අටක් වයසැති තරුණයෙකු සලිත කරවන්නක් නොවේ. එසේ වතුදු ආතා කතාව දිගු වේලාවක් යනතුරුම නැවැත්තුවේ නැත. ඒ දෙඩමළු කමේ රහස මට පසුව එලිවිය.

එදා දනය හමාර වී හාමුදුරුවරු ආපසු වැඩම කළ විගස තම කාමරයට ගිය ආතා, නිරතුරු තම ඇඳ යට තිබෙන පොල් අරක්කු බෝතලයෙන් "කාලක්-ක්‍රියා" කර ඇත. මෙහිදී ඔහුගේ සහයට සිටියේ, දනමය පුණ්‍ය කර්මයට සහභාගී වීමට නිවසට පැමිණ සිටි තම මස්සිනා ය. මෙය සුවිශේෂී සංසිද්ධියක් නොවේ. බොහොමයක් දනේ ගෙවල් වල ගිහියන්ට කරණ සංග්‍රහයට රහමෙර ද ඇතුලත් ය.

තව ස්වල්ප වේලාවකින් තමන් විසින් සිල් බිඳීමට නියමිත බව හොඳ හැටි දැන සිටියද, එදා පින්කමේ දී සුරාමේරය මජ්ඣපමා සීලය රැකුණි.

සැවොම පන්සිල් ගන්නා වෙලේ මා අත් බැඳ ගෙන සිටිනු දකින සමහරු මගෙන් ඒ ගැන විමසන හැම විටකම මා කියන්නේ අවශ්‍ය නම් මට ඔවුන්ට පන්සිල් දිය හැකි බවය.

රසික සූරියආරච්චි

[rasika.suriyaarachchi@gmail.com]

